**කහවත්ත ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 09 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගෙවියයුතු ගිණුම්

ණයහිමි ලේඛනය අනුව 2016 නොවැම්බර් 18 දින වනවිට ඉකුත් වර්ෂයන්ට අදාලව එකතුව රු. 3,787,548 ක ණය ශේෂයක් නිරීක්ෂණය වූ අතර, ණය පියවීමට 2017 ජූනි වනවිටත් කටයුතු කර නොතිබුණි.

**1.3.2 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

---

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වන වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටි මාර්ග හඳුනාගෙන සීමා ලකුණු කර පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් ගැසට් මඟින් ප්‍රසිද්ධ කල යුතු වුවත්, එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104 | පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාව වෙත ලැබී තිබුණු ඩබල් කැබ් රථය 2016 සැප්තැම්බර් 09 දින අනතුරකට ලක්වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 110 | සභාව විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 6,927,310 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 2,277,750 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,649,560 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලය රු. 4,649,560 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 05 ක රු. 3,739,067 ක වර්ධනය හා වියදම් විෂයයන් 01 ක රු. 1,272,415 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 3,258 | 3,413 | 2,274 |
| බදු කුලී | 6,979 | 4,506 | 600 |
| බලපත්‍ර ගාස්තු | 314 | 322 | - |
| වෙනත් ආදායම් | 51,435 | 33,102 | 13,523 |

**2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදු කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය පිළිවෙලින් සියයට 35 ක්, සියයට 15 ක්, සියයට 40 ක්, සියයට 55 ක් හා සියයට 44 ක් වශයෙන් විශාල ලෙස අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

### 2.3.3 වරිපනම්

----------

2016 සැප්තැම්බර් 30 දින වනවිට වරිපනම් ඒකක 662 කින් එකතුව රු. 2,246,810 ක හිඟ වරිපනම් ශේෂයක් තිබුණු අතර, එම ශේෂය තුල රු. 5,000 ට වඩා වැඩි වරිපනම් ඒකක 96 ක එකතුව රු. 1,398,500 ක් හෙවත් මුළු හිඟ ශේෂයෙන් සියයට 62 ක් විය.

### 2.3.4 බදුකුලී

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා විනෝද බදු ලෙස අයකල යුතු වටිනාකම් ප්‍රතිශතය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ අක්කර බදු ඒකක 41 කින් එකතුව රු. 71,143 ක හිඟ ශේෂයක් පැවති අතර, 2016 නොවැම්බර් 18 දින වනවිටත් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) කහවත්ත පැරණි වෙළඳපල කඩා ඉවත්කර කඩකාමර 48 කින් යුත් නව වෙළඳපල 2016 ජූලි 12 දින වනවිට ඉදිකර තිබුණද, කඩකාමර 32 ක් 2017 මාර්තු 10 දින වනවිටත් බදු දීමට කටයුතු කර නොතිබුණි. තවද, පැරණි වෙළඳපලේ ව්‍යාපාර කටයුතු කල ව්‍යාපාරිකයින් 14 දෙනෙකු නව වෙළඳපලේ කඩකාමර 15 ක ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන අතර, නව තක්සේරු වටිනාකම් මත කඩකුලී අය කිරීමකින් තොරව පැරණි කුලිය අයකරමින් පැවතුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වනවිට සභා අරමුදලට රු. 98,348 ක පාඩුවක් සිදුවී තිබුණි.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

----------------

1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක 1523/16 දරන 2008 ජනවාරි 25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ "ඇ" කොටසේ නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමේදී වර්ෂ 03 කින් පසුව බලපත්‍ර අළුත් කල යුතු වුවත්, සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍ර එසේ අළුත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුලදී කර්මාන්ත 02 ක් සඳහා පමණක් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර තිබුණු අතර, 2016

නොවැම්බර් 18 දින වනවිටත් සභා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 02 කින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් සභාව වෙත ලැබිය යුතු එකතුව රු. 557,800 ක් වූ මුද්දර ගාස්තු 2016 නොවැම්බර් 18 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර, එක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයකින් 2015 හා 2016 වර්ෂ වෙනුවෙන් අයවිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

මහජන අදහස් හා යෝජනා අනුව එකතු වටිනාකම රු. 14,300,000 ක් වූ ව්‍යාපෘති 65 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තුගත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් ව්‍යාපෘති 39 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 පෙබරවාරි 14 දිනැති අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව අනුව 2011 හා 2012 වර්ෂයන්ට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය වී තිබූ විෂයයන් 13 කට අදාල ඒකක 29 ක භාණ්ඩ ඌනතාවය සම්බන්ධයෙන් අදාල නිළධාරියාගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු. 93,180,390 ක් වූ ස්ථාවර වත්කම් සඳහා විස්තරාත්මක උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් නොකල අතර, ඉකුත් වර්ෂයේදීද විගණනය විසින් මේ පිළිබඳව අනාවරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් අදාල නිවැරදි කිරීම් කර නොතිබුණි.

(ඇ) සභාව සතු සුසාන භූමි 26 ක් පවතින නමුත් ඉන් 02 ක් පමණක් මැනීම් කටයුතු සිදුකර තිබූ අතර, ඉතිරි සුසාන භූමි 24 සභාව වෙත පවරා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේදී සභාව වෙත ලැබී තිබූණු කැබ් රථය දීර්ඝ කාලයක සිට අබලන් තත්ත්වයෙන් යුක්තව සහා භූමියේ ගාල් කර තිබූ අතර, එම රථය වෙන්දේසි කිරීම සඳහා 2015 මැයි 11 දින පළාත් පාලන දෙපාර්මේන්තුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණ ද අදාල අනුමැතිය ලබාගෙන අපහරණය කිරීමට 2017 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසලශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, සභාව විසින් කසලශෝධනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා ගැනීම සඳහා 2016 නොවැම්බර් 16 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා පනතේ 95 වන වගන්තිය ප්‍රකාරව වීථි වල එකතුවන කසල, නිවාස වල එකතුවන කසල, මල සහ එවැනි ද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමට පහසු ස්ථාන කලින් කලට සෑම ප්‍රාදේශීය සභාවක් විසින්ම සැපයිය යුතු අතර, පනතේ විධිවිධාන ප්‍රකාරව ඉවත් කරනු ලබන එකී කසල, මල හෝ එවැනි ද්‍රව්‍ය පීඩාවක් සිදුවන අන්දමින් බැහැර නොකෙරෙන බවට වගබලා ගැනීමට අවශ්‍ය විය හැකි සියළුම වැඩ පිළිවෙලවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන සැලැස්විය යුතු වුවත්, සභාව විසින් නගරයේ එකතුවන දිරන හා නොදිරන කසල සියල්ල හවුපෙවත්ත ප්‍රදේශයේ සභාව සතු නොවන විවෘත භූමියක වල දැමීම සිදු කරන බව විගණනයට නිරීක්ෂණය වූ අතර, එම ප්‍රදේශය අවට මැසි උවදුර වර්ධනය වීමෙන් මහජනතාවට පීඩාවක් සිදු වී ඇති බැවින් මහජන විරෝධතා එල්ල වී තිබුණි. ඒ අනුව කසල කළමනාකරණයට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවන බව විගණනයට නිරීක්ෂණය වූ අතර, මේ සම්බන්ධයෙන් පසුගිය විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබූ නමුත් සභාවේ අවධානය යොමුකර මෙම පාරිසරික ගැටළු නිරාකරණය කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සභාව විසින් 2015 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුල රු. 4,584,575 ක් වූ ව්‍යාපෘති වැඩ නිමකර තිබුණි. ඒ සඳහා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රු. 3,421,885 ක් පමණක් ලැබී තිබුණු නමුත් ඉතිරිය වූ රු. 1,162,690 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් සභාව වෙත ලබාගෙන නොතිබුණි.

(ආ) දොරින් දොරට ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති 11 ක් සඳහා 2014 වර්ෂයේදී අනුමත සමිති සමඟ ගිවිසුම්ගතවී ඉදිකිරීම් නිම කරන ලද එම කර්මාන්ත වෙනුවෙන් එකතුව රු. 2,946,111 ක් සභාව විසින් ගෙවීම් කල යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් අදාල මුදල් ලබාගෙන වගකීම් පියවා නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

**අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 32 කට අදාලව එකතුව රු. 4,911,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) වර්ගීකරණ දෝෂ |
| | | (ii) ගිණුම් වලින් අත්හැරීම් |
| | | (iii) වෙන්කිරීම් සිදු නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | නියමිත ආදායම් අයකර නොගැනීම |
| (ඇ) | අයවැය පාලනය | ප්‍රතිපාදන ඌන උපයෝජනය |

| | | |
|---|---|---|
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | විධිමත් ලෙස බැහැර නොකිරීම |
| (ඉ) | ලේඛන පවත්වාගෙන යාම | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම |